# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016
### 2022 මාර්තු/අප්‍රේල්
### මානවශාස්ත්‍ර පීඨය
### සාහිත්‍ය විචාරය - LTCR E 1015

### සාහිත්‍ය සන්නිවේදනය, සාහිත්‍ය ආචාරධර්ම හා විචාරය

පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි

1. පහත දැක්වෙන පද්‍ය රචනය විචාරයට පාත්‍ර කරන්න.

බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

සුදු පතළ හිම අතර නුහුරු නුපුරුදු ලොවකි
කොළ හැළී ඇට සැකිලි ගස් පෙනේ එක දිගට
මට අරුම ලොවක් මැද නැගෙයි තනිකම රුදුරු
මගේ ගම, මගේ බස, නෑසියන් නොම පෙනේ
මට ම දොස් පවරමින් මෙරට පිවිසීම ගැන
සිත සිතා උපන් රට ගැන නිබඳ දුක් වෙමින
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

මහා සාගරය මැද කුඩා දිවයිනෙකි මෙය
ඇමරිකන් බලය මත දනන් නිති පොළඹවන
මැරුණු ගිනිකඳු අතර වියරු ගිනිකඳු තිබෙන
මට නොරිසි මෙදූවට පැමිණියේ කුමකට ද?
මට පුරුදු සිප් කලා, කවි සිනා නොම ඇසෙන
තනිකමේ වෙළී ගෙන හද පිරුණු දොම්නසින
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

සිරුර ගිනි ගත් විලස කලබලෙන් දුව පනින
කාසි මලු සොය සොයා දිවා රෑ වෙහෙස වෙන
දනන් පිරි මේ රටෙහි නිහඬ බව මරා ඇති
ජීවිතේ අරුත කිමදැයි අසමි මම මගෙන්

චීන බසමයි දිවා රෑ සවන වැකෙන්නේ
මේ රටේ පාළුවක් දැනෙයි ඉවසිය නොහැකි
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස
එදා මෙන් අදත් තනි නොතනියට ඔබ පමණි
කාලයේ දේසයේ රැහැන් බිඳ මවෙත එන

2. ප්‍රතිභා, ව්‍යුත්පත්ති, සතතාභ්‍යාස යන කාව්‍ය සම්පත්ති පිළිබඳ විමර්ශනයක් කරන්න.

3. අත්දැකීම් හා පරිකල්පනය නිර්මාණ සාහිත්‍යය උදෙසා දායක වන ආකාරය සනිදර්ශනව පැහැදිලි කරන්න.

4. "විචාරය යනු නිර්මාණයේ තත්ත්වය නිර්ණය කිරීමකි." විවරණය කරන්න.

5. කාව්‍යකරණය හා විචාරය සමඟ බැඳුණු ආචාරධර්ම පිළිබඳ විමසීමක් කරන්න.

6. "වර්තමාන සිංහල කාව්‍ය විචාරය ගොඩනැඟී ඇත්තේ පෙරදිග මූලධර්ම මෙන් ම අපරදිග මූලධර්ම ද ආශ්‍රය කොට ගනිමිනි." සාකච්ඡා කරන්න.

7. ප්‍රායෝගික විචාරයේදී නිර්මාණාත්මක භාෂා ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානය යොමු වන ආකාරය සාධක සහිතව පැහැදිලි කරන්න.

8. ජයතිලක කම්මැල්ලවීරගේ සොබා කෙටිකථා සංග්‍රහයේ එන අභිමත කථාවක් සමාජ විද්‍යාත්මක විචාර මූලධර්ම ආශ්‍රයෙන් විවරණය කරන්න.